## පේරාදෙණිය විශ්වවිද්‍යාලය - 2013

පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ 2013 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 107(5), 108 සහ 111 වගන්ති සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර, මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. විශ්වවිද්‍යාල පනතේ 108(1) උප වගන්තිය ප්‍රකාර, ආයතනයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

### 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමණාකරණයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති වියහැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

### 1.3 විගණකගේ වගකීම

උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000 - 1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව පවත්වනු ලබන විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ.

### 1.4 මතය ව්‍යාචනය සඳහා පදනම

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවල ප්‍රතිඵලයක් ලෙස මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ, ආදායම් ප්‍රකාශනයේ, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනයේ සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ වාර්තාගත වූ හෝ වාර්තාගත නොවූ හෝ විෂයයන් සහ මූලිකාංගවලට අදාලව කවර හෝ ගැලපීම් කිරීමේ අවශ්‍යතාවයක් තිබුණේදැයි තීරණය කිරීමට මට නොහැකිය.

## 2. මූල්‍ය ප්‍රකාශන

### 2.1 මතය ව්‍යාචනය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති වැදගත් කරුණු හේතුවෙන් විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් සහ උචිත විගණන සාක්ෂි ලබාගැනීමට මට නොහැකි විය. ඒ හේතුකොට ගෙන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මම මතයක් ප්‍රකාශ නොකරමි.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 2.2.1 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය තුළදී එකතුව රු. 4,928,578 ක පුනරාවර්තන වියදම් මූලධන ප්‍රතිපාදන මඟින් ද, රු. 1,065,332 ක ප්‍රාග්ධන වියදම් පුනරාවර්තන ප්‍රතිපාදනවලින්ද දරා තිබුණි.

---

(ආ) පූර්ව අධිකාරී බලයක් නොමැතිව පර්යේෂණ අරමුදල් 28 ක සහ වෙනත් අරමුදල් 11 ක ප්‍රතිපාදන ඉක්මවා පිළිවෙලින් එකතුව රු.3,321,486 ක සහ රු.2,210,359 ක වියදම්ද, ප්‍රතිපාදන නොමැතිව පර්යේෂණ 12 ක් සහ වෙනත් අරමුදල් 02 ක් සඳහා එකතුව රු. 360,508 ක වියදම් දරා තිබුණු අතර, මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී මෙම අරමුදල්වල ඍණ ශේෂයන් ධන ශේෂයන් සමඟ ගැලපීම් කොට මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ දක්වා තිබුණි.

(ඇ) දුරස්ථ හා අඛණ්ඩ අධ්‍යයන කේන්ද්‍රයේ සමාලෝචිත වර්ෂයේ රු.71,224,806 ක වියදම මූල්‍ය ප්‍රකාශනවල රු. 65,538,406 ක් ලෙස දැක්වීම හේතුවෙන් වර්ෂයේ මුළු වියදම රු. 5,686,400 ක් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ඈ) දුරස්ථ හා අඛණ්ඩ අධ්‍යයන කේන්ද්‍රය සතු රු. 4,928,561 ක දේපල, පිරියත හා උපකරණ වටිනාකමින් රු. 1,468,164 ක් වටිනා වත්කම්වලට අදාළ ක්ෂය ප්‍රමාණය මූල්‍ය ප්‍රකාශනවල අඩුවෙන් දක්වා තිබුණි.

(ඉ) දුරස්ථ හා අඛණ්ඩ අධ්‍යයන කේන්ද්‍රයේ අපහරණ ක්‍රියාවලිය මඟින් භාවිතයෙන් ඉවත් කරන ලද රු. 2,038,387 ක් වූ විවිධ ස්ථාවර වත්කම්වල වටිනාකම පොත්වලින් ඉවත් නොකර දීර්ඝකාලයක් තිස්සේ ගිණුම්වල දක්වා තිබීම නිසා වත්කම්වල ශුද්ධ වටිනාකම වැඩියෙන් දක්වා තිබුණි.

(ඊ) තොරතුරු තාක්ෂණ මධ්‍යස්ථානයට අයත් රු. 417,034 ක් වූ පුහුණු අත්පොත් 1913 ක් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ අවසන් තොග පිරිවැයට ඇතුළත් කර නොතිබුණි.

(උ) සමාලෝචිත වර්ෂයේ දී තොරතුරු තාක්ෂණ මධ්‍යස්ථානයට මිලදී ගන්නා ලද රු.4,950,000 ක පරිගණක යන්ත්‍රවල පිරිවැය වටිනාකම සහ ඒ සඳහා වූ සමාලෝචිත වර්ෂයේ රු. 675,370 ක ක්ෂය වටිනාකම මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් කර නොතිබුණි.

(ඌ) පසුගිය වර්ෂයට අදාළව තොරතුරු තාක්ෂණ මධ්‍යස්ථානයේ පවත්වන ලද වැඩමුළු හා පාඨමාලා 16 කට ලැබිය යුතු එකතුව රු. 642,271 ක පාඨමාලා ගාස්තු අනුමැතියකින් තොරව පොදු සංචිතයෙන් කපා හැර තිබුණි.

(එ) මූල්‍ය ප්‍රකාශනවල පර්යේෂණ ප්‍රදාන උපලේඛනයේ ගිණුම් අංක 1301071201 යටතේ රු. 169,895 ක ඍණ ශේෂයක් දක්වා තිබුණ නමුත්, ප්‍රධාන ලෙජර් ගිණුමේ එවැනි ශේෂයක් නොතිබුණි.

(ඒ) සමාලෝචිත වර්ෂය තුළ ජාතික විද්‍යා පදනම මඟින් ලබාදී තිබූ රු. 907,424 ක් වටිනා උපකරණ සහ වෛද්‍ය පීඨයට අයත් රු. 272,067 ක භාණ්ඩ සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන මඟින් හෙළිදරව් කර නොතිබුණි.

(ඔ) ස්ථාවර වත්කම් මිලදී ගැනීම සඳහා භාණ්ඩාගාරයෙන් ලැබී තිබුණු ප්‍රතිපාදනය ඉක්මවා රු.104,221,372 ක් වියදම් කිරීම හේතුවෙන් ඇති වී තිබුණු ඍණ ශේෂ ධන ශේෂයන් සමඟ ගලපා ශුද්ධ ප්‍රතිඵලය පමණක් මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ වියදම් නොකළ ප්‍රාග්ධන ප්‍රදාන යටතේ දක්වා තිබුණි.

(ඕ) සමාලෝචිත වර්ෂයේ එකතුව රු.37,225,638 ක් වූ විදේශ ශිෂ්‍ය ආදායම, ආදායම් ප්‍රකාශයේ රු. 36,970,240 ක් ලෙස දැක්වීම හේතුවෙන් විදේශ ශිෂ්‍ය ආදායම් රු.255,398 ක් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ක) 2005 වර්ෂයේ සිට 2012 වර්ෂය දක්වා පැවැති වර්ගීකරණය නොවූ හා ඒකක වටිනාකම් හඳුනා නොගන්නා ලද එකතුව රු.13,168,099 ක තොග ගැලපුම් ගිණුමට බැර කරන ලද ශේෂය නිරවුල් කිරීම සඳහා ආදායම් හා වියදම් විසර්ජන ගිණුමට ආදායමක් ලෙස බැර කර තිබුණි.

(කා) සමාලෝචිත වර්ෂය තුළදී වැඩ නිමකර භාරදී තිබුණු ශාස්ත්‍ර පීඨයේ රු.1,747,318 ක් වූ කොන්ත්‍රාත්තු 02 ක වටිනාකම් ප්‍රාග්ධනිත කිරීමට කටයුතු කර නොතිබුණි.

(කැ) පශු වෛද්‍ය පීඨයේ ශික්ෂණ රෝහල ඉදිකිරීමේ කොන්ත්‍රාත්තුව වෙනුවෙන් රු.44,000,000 ක මුදලක් අමාත්‍ය මණ්ඩලය අනුමත කර තිබූ අතර, වැඩ අවසන් කර ප්‍රාග්ධනිත කිරීමේදී රු.45,471,987 ක් ප්‍රාග්ධනිත කිරීම හේතුවෙන් රු.1,471,987 ක් වැඩිපුර ප්‍රාග්ධනිත කර තිබුණි.

(කෑ) ගිවිසුම් කඩකල ආචාර්යවරුන් හා නිලධාරීන් 122 දෙනෙකුගෙන් ලැබිය යුතු රු.153,137,696 ක ශේෂයක් සේවක අර්ථසාධක අරමුදලින් අයකිරීමට කටයුතු කර නොතිබුණි.

(කි) මහනුවර ගඟවට කෝරලේ ප්‍රාදේශීය සභා බලප්‍රදේශය තුළ පිහිටි පේරාදෙණිය විශ්වවිද්‍යාලය සතු දේපල සඳහා 1997 වර්ෂයේ සිට 2008 වර්ෂය දක්වා ගෙවිය යුතු එකතුව රු.1,034,839 ක් වූ වරිපනම් බදු මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි.

(කී) 2007 / 2008 අධ්‍යයන වර්ෂයේ සිසුන්ගේ අධ්‍යයන කාලය 2012 වසරෙන් අවසන් වන අතර, එම වර්ෂයට අදාළව සිසුන් 09 දෙනෙකුගෙන් ලැබිය යුතු රු.5,850,000 ක මුදල සමාලෝචිත වර්ෂයේ ලැබිය යුතු ආදායමක් ලෙස ගිණුම්ගත කර තිබුණි.

(කු) පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ ඉඩම් අක්කර 1390 රූඩ් 02 පර්චස් 21.6 ක් සහ ශිෂ්‍ය නේවාසිකාගාර 03 ක් සහ "සී" වර්ගයේ නිවාස 03 ක අගය තක්සේරු කර එම වටිනාකම් මූල්‍ය ප්‍රකාශනවල දැක්වීමට කටයුතු කර නොතිබුණි.

(කූ) සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට උපචිත වියදම් නිශ්චිතව හඳුනාගෙන ඒ සඳහා වෙන්කිරීම් කළ යුතු වුවත්, අදාළ වියදම් හඳුනා ගැනීමකින් තොරව වෙන් කිරීම් කිරීමෙන් රු. 37,733,400 ක උපචිත වියදම් අධි වෙන්කිරීමක් නිරීක්ෂණය විය.

(කෙ) ක්ෂය අඩුකළ පසු අගය ශූන්‍ය වටිනාකම් ඇති ස්ථාවර වත්කම් නැවත ප්‍රයෝජනයට ගන්නේ නම් එම වත්කම් ප්‍රත්‍යාගණනය කිරීමට කටයුතු කළයුතු වුවද, ගත් මිල රු.1,666,744,282 ක් වූ ස්ථාවර වත්කම් අයිතම 04 ක් සම්බන්ධයෙන් ඒ අනුව කටයුතු කර නොතිබුණි.

(කේ) එකතුව රු. 3,863,394 ක්වූ පර්යේෂණ අරමුදල් ශේෂ වර්ෂ කිහිපයක සිට ඉදිරියට ගෙන එන ශේෂයන් වන අතර, එම ශේෂ නිරවුල් කිරීමට හෝ අදාල පර්යේෂණ සඳහා අරමුදල් යෙදවීමට කටයුතු කර නොතිබුණි.

2.2.2 නොසැසඳූ පාලන ගිණුම්
---------------------------

විෂයයන් 03 කට අදාල එකතුව රු. 71,653,182 ක් වූ ගිණුම් ශේෂ ඊට අදාල පාලන ගිණුම්වල එකතුව වූ රු. 78,049,609 ක ශේෂ සමඟ සැසඳීමේදී රු. 6,396,427 ක නොසැසඳීම් නිරීක්ෂණය විය.

2.2.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්
------------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) විශ්වවිද්‍යාලය තුළ පිහිටුවා ඇති බාහිර ආයතන 36 කින් අයවිය යුතු රු. 1,306,111 ක විදුලි වියදම් ද, අවු. 03 ට වැඩි කාලයක සිට ආයතන 07 කින් අයවිය යුතු රු. 512,783 ක ජල ගාස්තු ද 2013 දෙසැම්බර් 31 දින වන විටද අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) විශ්වවිද්‍යාලයට අයත් නිල නිවාස සඳහා එකතුව රු. 1,026,154 ක් වූ නිවාස කුලී පදිංචිකරුවන්ගෙන් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) විශ්වවිද්‍යාලය තුළ පිහිටුවා ඇති බාහිර ආයතනවලින් සහ විශ්වවිද්‍යාලය සතු ඉඩම් බද්දට දීමෙන් ආයතන 07 කින් අයකර ගතයුතු රු. 231,187 ක බදු ආදායම් සහ විශ්වවිද්‍යාලය තුළ පිහිටුවා ඇති ආයතන 03 කින් අවුරුදු 02 ට වැඩිකාලයක සිට අයවිය යුතු එකතුව රු. 119,145 ක දුරකථන ගාස්තු සමාලෝචිත වර්ෂයේ අවසන් දින වන විටත් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඈ) 1980 - 2009 දක්වා කාලපරිච්ඡේදයට අදාළ විශ්වවිද්‍යාලයේ පීඨ 08 ට අදාළ සිසුන්ගෙන් ලැබිය යුතු පාඨමාලා ගාස්තු සහ ඒ මත පැනවූ දඩ රු. 3,809,903 ක මුදලක් නිරවුල් කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට එකතුව රු. 351,774 ක් වූ නොපියවූ පර්යේෂණ අත්තිකාරම්  23 න්  11 ක් වර්ෂ 15-19 ත් අතරද, 08 ක් වර්ෂ 02-12 ත් අතර ද, 04 ක් වර්ෂ 08 - 13 ත් අතර ද විය.

(ඊ) අවුරුදු 10 කට වැඩි කාලයක සිට පැවත එන උත්සව අත්තිකාරම් ශේෂ 100 ක රු.223,827 ක එකතුවක්ද, නිලධාරීන් 05 දෙනෙකුට අදාළව 2002 සිට අක්‍රියව තිබූ ණය ශේෂ 05 ක එකතුව රු.223,524 ක්  සහ  2002 වර්ෂයේ සිට පවතින විදේශගත වූ නිලධාරීන්ගේ ණය ශේෂ 03 ක එකතුව රු. 162,987 ක්ද ඇතුළුව  මුළු වටිනාකම රු.610,338 ක් සමාලෝචිත වර්ෂයේ අවසන් දින වන විටත් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(උ) පේරාදෙණිය විශ්වවිද්‍යාලයට අයත් ගැටඹේ පිහිටි පර්චස් 40.97 ක ඉඩම 1987 දෙසැම්බර් 31 දින සිට 2017 දෙසැම්බර් 31 දින දක්වා වර්ෂ 30 ක කාලසීමාවක් සඳහා බදු ගිවිසුමක් මඟින් උඩරට ගැමි පුනරුත්ථාපන දෙපාර්තමේන්තුවට පවරා දී තිබූ අතර, 1992 දෙසැම්බර් 31 දින සිට 2013 දෙසැම්බර් 31 දින දක්වා කාලපරිච්ඡේදයට අදාළව එකතුව රු. 4,720,000 ක හිඟ බිම්කුලී විශ්වවිද්‍යාලය අයකරගෙන නොතිබුණි. 2008 වර්ෂයේ එහි නව දෙමහල් ගොඩනැගිල්ලක් ඉදිකර උඩරට සංවර්ධන අධිකාරිය පිහිටුවා තිබුණ නමුත්, ඒ සඳහා විශ්වවිද්‍යාලීය කළමණාකාරීවයෙන් කිසිදු විධිමත් අනුමැතියක් ලබා දී  නොතිබුණි.

(ඌ) විදේශීය සැපයුම් සේවා ලබා ගැනීම සඳහා පුද්ගලික සමාගමකට 2003 වර්ෂයේදී රු.318,892 ක් ගෙවීම් කර ඇතත්, එම සේවාව ලබාදීම සමාගම විසින් පැහැර හැර තිබූ බැවින් අදාළ මුදල අයකර ගැනීමට විශ්වවිද්‍යාලීය පරිපාලනය අසමත්ව තිබුණි.

2.2.4 විගණනය සඳහා සාක්ෂි නොවීම
-----------------------------------

සමාලෝචිත වර්ෂයේ එකතුව රු. 10,646,769,610 ක් වූ පහත දැක්වෙන ගිණුම් විෂයයන් 13 හි ඒවා ඉදිරියෙන් දක්වා ඇති සාක්ෂි විගණනයට ඉදිරිපත් නොවීය.

| | විෂයය | වටිනාකම | ඉදිරිපත් නොකළ සාක්ෂිය |
|---|---|---|---|
| | | රු. | |
| (අ) | පේරාදෙණිය විශ්වවිද්‍යාලය ජාත්‍යන්තර මට්ටමට ගෙන ඒම සඳහා දැරූ වියදම | 84,225,964 | අදාළ අරමුණු ඉටුකර ගත් බව තහවුරු කිරීම සඳහා තොරතුරු සහ සනාථ කිරීම් ලියවිලි |
| (ආ) | විවිධ ණයහිමියන් | 1,185,993 | වටිනාකම සනාථ කර ගැනීම සඳහා උපලේඛන හා ශේෂ තහවුරු ලිපි |
| (ඇ) | ශාස්ත්‍ර පීඨයේ කථිකාචාර්යවරුන් 06 ක් සහ නිලධාරීන් 08 දෙනෙකුට ලබා දුන් විශ්වවිද්‍යාල පර්යේෂණ අරමුදල් | 1,264,019 | පර්යේෂණ ව්‍යාපෘති හා වාර්තා |
| (ඈ) | පීඨ 07 කට අදාළව කථිකාචාර්යවරුන් 61 දෙනෙකු සඳහා පර්යේෂණ දීමනා | 11,483,905 | පර්යේෂණ වාර්තා |
| (ඉ) | ඉංජිනේරු පීඨයේ විදුලි හා විද්‍යුත් පශ්චාත් උපාධි පාඨමාලාව සඳහා කථිකාචාර්යවරුන් 05 සිදුකළ දේශන සඳහා ගෙවීම් | 351,000 | පැවැත් වූ දින, පැය සංඛ්‍යාව සහ පැයක් සඳහා ගෙවූ දීමනා |
| (ඊ) | දුරස්ථ හා අඛණ්ඩ අධ්‍යයන ඒකකයේ නියෝජ්‍ය අධ්‍යක්ෂ ලෙස සේවය කිරීම වෙනුවෙන් 2012, 2013 වර්ෂ තුළදී කළ ගෙවීම් | 342,276 | හඳුන්වාදුන් නව පාඨමාලා සහ විෂය නිර්දේශ සංවර්ධනය කිරීමේ කාර්යයන් |
| (උ) | 2009 සිට 2014 වර්ෂ සඳහා හඳුනා නොගත් ලැබීම් | 46,220,699 | වටිනාකම සනාථ කිරීමට අදාළ උපලේඛන |
| (ඌ) | දුරස්ථ හා අඛණ්ඩ අධ්‍යයන ඒකකයේ ස්ථාවර වත්කම් ප්‍රදාන | 1,468,164 | උපලේඛන සහ ලැබීම් සනාථ කිරීම් |
| (එ) | ස්ථාවර වත්කම් හා පරිගණක උපාංග | 10,422,295,853 | ස්ථාවර වත්කම් ලේඛනය සහ පරිගණක වත්කම් ලේඛනය |
| (ඒ) | A 0043 ප්‍ර්‍රනලයෙන් කෙරීගෙන යන වැඩ ශිණුමට හර කර තිබූ කොන්ත්‍රාත් වටිනාකම | 68,968,339 | කොන්ත්‍රාත් වටිනාකම්වලට අදාළ සනාථ කිරීම්, පරිවැය වටිනාකම සහතික කළ වාර්තා |
| (ඔ) | කෘෂිකර්ම විද්‍යා පශ්චාත් උපාධි ආයතනයෙන් සහ යාපනය විශ්වවිද්‍යාලයෙන් ලැබිය යුතු සහ යාපනය විශ්වවිද්‍යාලයට ගෙවිය යුතු වටිනාකම් | 5,520,523 | ලැබිය යුතු සහ ගෙවිය යුතු වටිනාකම් සම්බන්ධයෙන් ශේෂ සනාථ කිරීම්, උපලේඛන |
| (ඕ) | විද්‍යා පශ්චාත් උපාධි ආයතනයෙන් ලැබිය යුතු විදුලි ගාස්තු | 359,336 | ශේෂ සනාථ කිරීම් |

| | | | |
|---|---|---|---|
| (ක) | ගිවිසුම් කඩකළ ආචාර්යවරු හා නිලධාරීන් 13 දෙනෙකුගේ ඇප බැඳුම්කර වටිනාකම අයකර ගැනීමට අදාළ සුරක්ෂිතයන් | 3,083,539 | සේවක අර්ථසාධක අරමුදල් හිමිකාරීත්වය පිළිබඳ තොරතුරු |
| | | ------------------ | |
| | | 10,646,769,610 | |
| | | =========== | |

2.2.5 නීති රීති, රෙගුලාසි හා කළමණාකරණ තීරණ වලට අනුකූල නොවීම

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| නීති රීති, රෙගුලාසි යනාදියට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| **(අ) විශ්වවිද්‍යාල ආයතන සංග්‍රහය** | |
| විශ්වවිද්‍යාල ආයතන සංග්‍රහයේ xxv වැනි පරිච්ඡේදයේ 2.2(ඊ) වගන්තිය | 2013 වර්ෂය තුළ සිදු වූ රු. 161,470 ක වටිනාකමින් යුතු වාහන අනතුරු මඟින් සිදු වී ඇති හානි විගණකාධිපති වෙත වාර්තා කර නොතිබුණි. |
| විශ්වවිද්‍යාල ආයතන සංග්‍රහයේ II කොටස IX පරිච්ඡේදය 03 ඡේදය | පුනරාවර්තන ගිණුමට අතිකාල දීමනා ගෙවීම සඳහා ප්‍රාග්ධන වැය ගිණුමින් රු. 8,000,000 ක මුදලක් මාරු කර තිබුණි. |
| 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ XIII වන කොටසේ 99(1) වගන්තිය | විශ්වවිද්‍යාල අරමුදලට බැර විය යුතු මුදල් රු.22,022,236 ක් පශු වෛද්‍ය පීඨය මඟින් පාලනය වන විවිධ අරමුදල් 18 ට බැර කොට තිබුණි. |
| විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ 2005 පෙබරවාරි 03 දිනැති අංක 2005/01 දරන චක්‍රලේඛය ප්‍රකාරව හා සේවක අර්ථසාධක හා සේවා නියුක්ති භාරකාර අරමුදල් පනත | එකතුව රු. 114,192 ක් වූ සේවක අර්ථසාධක අරමුදල් හා සේවා නියුක්ති භාරකාර අරමුදල් දායකය අදාළ අරමුදල් වෙත යැවීමට කටයුතු කර නොතිබුණි. |
| 2012 අප්‍රේල් 16 දිනැති විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛ 7/2012 සහ 2003 දෙසැම්බර් 29 දිනැති අංක 837 දරන චක්‍රලේඛය | චක්‍රලේඛ උපදෙස් ප්‍රකාරව, දේශන දීමනා සඳහා පැයකට රු. 1500 ක් හා ප්‍රායෝගික පුහුණු සඳහා පැයකට රු. 200 ක් ගෙවිය හැකි වුවද, පුහුණු වැඩසටහන් 09 ක් සඳහා දේශන පැය 01 කට රු.1,750 ක් හා ප්‍රායෝගික පුහුණු සඳහා පැය 01 ක් සඳහා රු. 1,500 ක් බැගින් රු.160,250 ක් ගෙවා තිබීම හේතුවෙන් වැඩිපුර රු.64,150 ක් ගෙවා තිබුණි. |
| **(ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි** | |
| මුදල් රෙගුලාසි 71 | ශාස්ත්‍ර පීඨයේ අධ්‍යයන හා අනධ්‍යයන කාර්ය මණ්ඩලය මානව හිමිකම් මධ්‍යස්ථානයේ කටයුතු කිරීම වෙනුවෙන් එකතුව රු. 745,520 ක දීමනා ගෙවා තිබුණි. |

| | | |
|---|---|---|
| මුදල් රෙගුලාසි 104, 104(3) | | 2011 පෙබරවාරි 08 දින අනතුරටපත් අංක CPPB - 5574 දරන වාහනයේ රු. 651,452 ක අනතුරට අදාළ ඇස්තමේන්තු වටිනාකම සම්බන්ධව හා 2013 ජුලි 31 දින ශාස්ත්‍ර පීඨයට අයත් අංක CPNB 3979 දරන වෑන් රථයට සිදු වූ රු. 27,922 ක අනතුර සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. |
| මුදල් රෙගුලාසි 371 | i. | තත්කාර්ය අතුරු අග්‍රිමයක් ලබාදිය යුත්තේ අවශ්‍ය ප්‍රමාණයට වුවත් ඉංජිනේරු පීඨයේ අවස්ථාවන් 07 කදී සහ වෛද්‍ය පීඨයේ අවස්ථා 06 කදී අවශ්‍ය ප්‍රමාණයට වඩා වැඩිපුර රු.192,890 ක අත්තිකාරම් ලබා දී තිබුණි. |
| | ii. | වෛද්‍ය පීඨයේ ආචාර්යවරයෙකු වෙත අවස්ථා 03 කදී රු.950,000 ක අත්තිකාරම් මුදලක් ලබා දී තිබුණි. |
| මුදල් රෙගුලාසි 371(1) | i. | කෘෂිකර්ම විද්‍යා පීඨයේ එකතුව රු. 201,468 ක වටිනාකමින් යුතු අත්තිකාරම් මුදල් බාහිර ආයතන 05 ක් වෙත අවස්ථා 06 කදී ලබාදී තිබුණි. |
| | ii. | ශාරීරික අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ විසින් ලබාගත් එකතුව රු. 655,700 ක අත්තිකාරම් මුදල්වලින් රු. 629,760 ක් ක්‍රීඩා උපදේශවරුන් වෙත ලබා දී තිබුණි. |
| මුදල් රෙගුලාසි 371(2)(ආ) | | ඉංජිනේරු පීඨයේ අවස්ථා 08 කදී රු.335,325 ක වටිනාකමින් යුතු අත්තිකාරම් ද, වෛද්‍ය පීඨයේ නිලධාරීන් 05 දෙනෙකුහට අවස්ථා 06 කදී එකතුව රු. 675,000 ක වටිනාකමින් යුත් අත්තිකාරමක් ද, කෘෂිකර්ම විද්‍යා පීඨයේ අවස්ථා 52 කදී එකතුව රු.2,403,993 ක වටිනාකමින් යුතු අත්තිකාරම් ද සීමාව ඉක්මවා ලබා දී තිබුණි. |
| මුදල් රෙගුලාසි 754, 756(1) සහ 758(1) | | ඉංජිනේරු පීඨයේ වැඩ ඒකකය සතු ආයුධ හා පාරිභෝජ්‍ය භාණ්ඩ ගබඩා 02 ට අදාළව වාර්ෂික සමීක්ෂණ කටයුතු 1997 වර්ෂයට පෙර සිට සමාලෝචිත වර්ෂය දක්වා සිදුකර නොතිබුණු අතර, ඇතැම් ආයුධ දීර්ඝ කාලයක සිට පාවිච්චිය අත්හැර දමා තිබුණි. |

(ඇ) චක්‍රලේඛ
-----------

| | |
|---|---|
| 1990 ඔක්තෝබර් 10 දිනැති අංක 40/90 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | මාස 06 කට වරක් වාහනවල ඉන්ධන පරිභෝජනය සම්බන්ධයෙන් වගකිවයුතු මාණ්ඩලික නිලධාරී මගින් පරීක්ෂා කර බලා මාසික ඉන්ධන තුලනයට කටයුතු කළයුතු වුවත්, පශු වෛද්‍ය පීඨය සතු වාහන 10 ක් සම්බන්ධයෙන් එලෙස කටයුතු කර නොතිබුණි. එසේ වුවත්, වාහනවල ඉන්ධන සඳහා සමාලෝචිත වර්ෂය |

| | |
|---|---|
| | තුළදී රු. 2,628,578 ක් වටිනා ඉන්ධන ලීටර් 21389 ක් භාවිතා කර තිබුණි. |
| 2002 නොවැම්බර් 28 දිනැති අංක IAI/2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | පරිගණක, උපාංග සහ මෘදුකාංග සම්බන්ධයෙන් ස්ථාවර වත්කම් ලේඛණයක් නඩත්තු කළයුතු වුවද, පීය 03 ක සහ තොරතුරු තාක්ෂණ මධ්‍යස්ථානයේ රු. 81,004,368 ක් වටිනා පරිගණක සම්බන්ධව එවැනි ස්ථාවර වත්කම් ලේඛණයක් නඩත්තු කර නොතිබුණි. |

(ඇ) කළමනාකරණ හා අභ්‍යන්තර නියෝග
-----------------------------------------

| | |
|---|---|
| 2002 සැප්තැම්බර් 21 දිනැති 307.10.2 පාලක සභා තීරණයේ 4.2 ඡේදය | වර්ෂ 05 කට වරක් නිවාස කුලී සංශෝධනය කර නොතිබීම හේතුවෙන් 2008 ජනවාරි 01 සිට 2012 දෙසැම්බර් 31 දක්වා රු. 11,877,000 ක කුලියක් හා 2013 වර්ෂයේ සැප්තැම්බර් 30 වන විට 2013 වර්ෂයට අදාළව රු.5,344,650 ක කුලියක් විශ්වවිද්‍යාලය විසින් අඩුවෙන් අයකර තිබුණි. |

2.2.6 ප්‍රමාණවත් අධිකාරී බලයකින් තහවුරු නොවූ ගනුදෙනු
-------------------------------------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) මුදල් රෙගුලාසි 835(2)(ඇ) වගන්තියේ විධිවිධානවලට අනුකූල නොවන ලෙස මෙම විශ්වවිද්‍යාලයේ ශිෂ්‍ය නේවාසිකාගාර සඳහා අගුනාවල සහ කිරිබත්කුඹුර ප්‍රදේශවලින් ගොඩනැගිලි 03 ක් මසකට රු. 196,000 ක් බැගින් වර්ෂයකට කුලිය රු.2,352,000 ක් සඳහා ගිවිසුම් අත්සන් කර ඊට අදාලව මාස 06 ක කුලිය ගෙවා තිබුණි.

(ආ) ස්ථිර සේවයේ නියුතු අචාර්යවරුන් සිටියදී එම විෂයන් ඉගැන්වීම සඳහා බාහිර කථිකාචාර්යවරුන් යොදවා ගැනීම හේතුවෙන් සමාලෝචිත වර්ෂය තුළදී ශාස්ත්‍ර පීඨයේ විෂයයන් 103 ක් හා ඉංජිනේරු පීඨයේ විෂයයන් 20 ක් සඳහා පිළිවෙලින් රු.4,652,160 ක් හා රු. 1,132,322 ක්ද ලෙස බාහිර දේශකයින්ට දේශන ගාස්තු ගෙවා තිබුණි.

(ඇ) 1990 පෙබරවාරි 06 දිනැති විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ අංක 422 චක්‍රලේඛය, 1994 ජුනි 14 දිනැති ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අංක 95 චක්‍රලේඛයේ 02 වගන්තිය, 2003 ජනවාරි 09 දිනැති අංක PEI/174/1-2003 දරන මුදල් අමාත්‍යාංශ චක්‍රලේඛය යන චක්‍රලේඛවල විධිවිධානවලට පටහැනිව අනුමැතියකින් තොරව, පාඨමාලා සම්බන්ධීකරණ දීමනා වශයෙන් රු.628,800 ක්ද, ගෞරවාන්විත දීමනා වශයෙන් රු.102,500 ක්ද, පශ්චාත් උපාධි පාඨමාලා වෙනුවෙන් රු.84,500 ක්ද ගෙවා තිබුණි.

3. මූල්‍ය සමාලෝචනය
------------------------

3.1 මූල්‍ය ප්‍රතිඵල
---------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රතිඵලය රු. 655,872,586 ක ඌනතාවයක් වූ අතර, ඊට අනුරූපව ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය රු.405,269,886 ක ඌනතාවයක් වූයෙන් සමාලෝචිත වර්ෂයේදී ඌනතාවය රු.250,602,700 කින් වැඩි වී තිබුණි.

4. මෙහෙයුම් සමාලෝචනය
----------------------------

4.1 කළමණාකරණ අකාර්යක්ෂමතා
------------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) (i) ජාත්‍යන්තර මට්ටමේ පර්යේෂණ කිරීම සඳහා පර්යේෂණ මධ්‍යස්ථානයක් ඇතිකර එහි අරමුණු ඉටුකිරීම සඳහා සමාලෝචිත වර්ෂය තුළ රුපියල් මිලියන 100 ක ප්‍රතිපාදන විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවෙන් ලබා දී තිබුණි. මේ සඳහා කිසිදු සැලැස්මකින් තොරව අරමුණු හා ඉලක්කවලට පරිභාහිරව රු. 84,255,964 ක් වැයකර පීඨ සඳහා කාර්යාල උපකරණ සහ වැටුප් හා දීමනා ලබා දීම සිදුකර තිබුණි.

(ii) ජාත්‍යන්තර වැඩමුළුවලට සහභාගී වීම සඳහා කාර්ය මණ්ඩලයට හා ශිෂ්‍යයින් වෙනුවෙන් රුපියල් මිලියන 04 ක මුදලක් වෙන්කර රු. 7,371,998 ක් වැයකර ඇතැත් කිසිදු ශිෂ්‍යයකු හෝ ආචාර්යවරයෙකු එම අරමුණු සඳහා යොදවාගෙන නොතිබුණි.

(iii) විශ්වවිද්‍යාල පනතේ 101(ඈ) වගන්තියට අනුව නිශ්චිත අරමුණක් සඳහා ලැබුණු මුදල් එම කාර්යයට පරිභාහිර කාර්යය සඳහා වැය නොකළ යුතු වුවත්, ඊට අනුකූල නොවන පරිදි ඉකුත් වර්ෂයේ විශ්වවිද්‍යාලීය මූලධන ප්‍රතිපාදන මගින් රු. 4,033,627 ක මුදලක් ජාත්‍යන්තර පර්යේෂණ මධ්‍යස්ථාන ව්‍යාපෘතියේ වියදම් සඳහා වැය කර තිබුණි.

(ආ) විශ්වවිද්‍යාල ආයතන සංග්‍රහයේ X පරිච්ඡේදයේ II 27(1) වන වගන්තිය ප්‍රකාරව, අධ්‍යයන නිවාඩු ලබාගත හැකි උපරිම කාල සීමාව මාස 39 ක් වුවද, 2003 වර්ෂයේ ආචාර්ය උපාධියක් ලබා ගැනීම සඳහා මාස 06 වැටුප් සහිත නිවාඩු ලබා ගෙන තිබුණු කථිකාචාර්යවරියක් සඳහා නැවත එංගලන්තයේ ලීසෙස්ටර් විශ්වවිද්‍යාලයේ ආචාර්ය උපාධිය හැදෑරීම සඳහා 2007 සිට 2012 දක්වා මාස 50 කුත් දින 09 ක් ලබාගෙන ඇතත්, සමාලෝචිත වර්ෂයේ අවසන් දින වන විටත් ආචාර්ය උපාධිය ලබාගෙන නොතිබුණි. කෙසේ වෙතත් මෙම කථිකාචාර්යවරිය විදේශගත වූ බවට සනාථ කර ගත හැකි සාක්ෂි වන විදේශ ගමන් බලපත්‍රය සහ ලබාගත් ආචාර්ය උපාධි සහතිකය විගණනයට ඉදිරිපත් නොවුණු අතර, විශ්වවිද්‍යාල අරමුදලින් ඇය වෙනුවෙන් දරා ඇති රු. 2,426,474 ක මුදල ඵලදායී වැටුප් වශයෙන් නිරීක්ෂණය නොවුණි.

(ඇ) ඉංජිනේරු පීඨයේ වාහන වැඩ ඒකකය 2013 මාර්තු මාසයේදී ආරම්භ කර සමාලෝචිත වර්ෂය තුළ සේවක වැටුප් හා දීමනා සඳහා රු.1,529,610 ක වියදමක් දරා තිබුණු නමුත්, විශ්වවිද්‍යාලය සතු සෑම වාහනයක්ම වාහන වැඩ ඒකකය වෙත අලුත්වැඩියාවන් සහ නඩත්තු සඳහා යොමුකර නොතිබුණු බැවින්, සමාලෝචිත වර්ෂයේදී ද රු. 10,186,609 ක වියදමක් දරමින් වාහන පුද්ගලික ආයතන මගින් අලුත්වැඩියාවන් සහ නඩත්තු කටයුතු සිදු කර තිබුණි.

(ඇ) පශු වෛද්‍ය පීඨයේ ගොවිපල සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව යටතේ ගොවිපල කළමණාකරුවකු අනුමත කර තිබුණද, විගණන දිනය වූ 2014 ජනවාරි 17 දින වන විටත්, වර්ෂය තුළ පර්යේෂණ අරමුදල්වලින් රු. 251,336 ක් වැටුප් ගෙවා කොන්ත්‍රාත් පදනම මත බඳවා ගෙන ඇති නිලධාරියෙකුහට මාවලවත්ත ගොවිපලේ අධික වටිනාකමකින් යුක්ත වූ සතුන් හා දේපලවල භාරකාරීත්වය හා වගකීම පවරා තිබුණි.

(ඉ) පශු වෛද්‍ය රෝහල සඳහා මුදල් රෙගුලාසි 71 ප්‍රකාරව, නව තනතුරු ඇතිකිරීමට සහ අනුමත සේවක සංඛ්‍යාව වැඩිකිරීමට කටයුතු කර නොමැතිව පශු වෛද්‍ය රෝහල නඩත්තු අරමුදලින් සමාලෝචිත වර්ෂයේ එකතුව රු. 1,213,597 ක වැටුප් ගෙවමින් තාවකාලික පදනමින් සේවකයින් 10 දෙනෙකු බඳවා ගෙන තිබුණි.

(ඊ) 2013 ජනවාරි 14 දිනැති ඒ/05 ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරීගේ (පාලන) ලිපිය පරිදි 2013 වර්ෂය තුළදී හදිසි රාජකාරී ගමන් සඳහා පීඨයේ වාහන ප්‍රමානවත් නොවේ නම් වෙනත් පීඨයකින් වාහනයක් සපයා ගතයුතු අතර එසේ නොහැකිනම් පමණක් පෞද්ගලික වාහනයක සේවය ලබා ගැනීම කළයුතු වුවත්, පශු වෛද්‍ය පීඨය සතුව වාහන 08 ක් තිබියදී 2013 වර්ෂයේ පෞද්ගලික වාහන සැපයුම්කරුවකුගේ සේවය ලබාගෙන පර්යේෂණ අරමුදල්වලින් පෞද්ගලික වාහන සැපයුම්කරුට රු.531,019 ක් ගෙවා තිබුණි.

(උ) පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ ඉංජිනේරු පීඨයේ සිවිල් ඉංජිනේරු දෙපාර්තමේන්තුවේ ශිෂ්‍යයින්ගේ අධ්‍යයන පර්යේෂණ සඳහා වූ රසායනාගාර 05 ක් මඟින් සිදුකළ යුතු අධ්‍යයන පර්යේෂණ වෙනුවට විශ්වවිද්‍යාලයේ මානව හා භෞතික සම්පත් උපයෝගී කර ගෙන සාමාන්‍ය රාජකාරී වේලාවේදී බාහිර පාර්ශවයන්ගෙන් පරීක්ෂණ භාර ගෙන පරීක්ෂණ වාර්තා නිකුත් කර ඒ සඳහා 2012 සහ 2013 වර්ෂවලදී පිළිවෙලින් රු.6,137,738 ක් සහ රු.13,362,371 ක ආදායමක් උපයා ගෙන ඉන් පිළිවෙලින් රු.3,521,704 ක් සහ රු.4,136,194 ක් රසායනාගාර තුළ සේවය කරන රසායනාගාර භාර කථිකාචාර්යවරුන් සහ රසායනාගාර කාර්යභාර නිලධාරීන් සඳහා 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ107(6)(අ) වගන්තිය අනුකූල නොවන පරිදි ගෙවා තිබුණි.

(ඌ) මූලධන ගෙවීම් යටතේ නේවාසිකාගාර සඳහා බෙදා දීමට 2013 මාර්තු 05 දින රු.5,366,770 ක වටිනාකමින් යුතු ලී පුටු සහ ලී මේස මිලදී ගෙන තිබූ අතර, ඒවා නියමිත පිරිවිතරවලට අනුකූල නොවූ අතර, එයින් රු. 417,600 ක් වටිනා මේස 36 ක් 2014 ජනවාරි 31 දින වන විටත් කිසිදු ප්‍රයෝජනයකට ගෙන නොතිබුණි.

(එ) විශ්වවිද්‍යාල ආයතන සංග්‍රහයේ II කොටසේ 08 පරිච්ඡේදයේ 6.2 ඡේදය ප්‍රකාරව, රජයේ සේවයෙන් ලබාගත් පුහුණුව සහ දැනුම භාවිතා කරමින් කාර්යාල වේලාවෙන් බැහැරව හෝ අනුමැතියක් ඇතිව කාර්යාලීය වේලාව තුළ කරනු ලබන කාර්යාලීය නොවන වැඩ වෙනුවෙන් ලැබෙන ගාස්තුවෙන් සියයට 10 ක් විශ්වවිද්‍යාල අරමුදලට බැර කළයුතු වුවත්, පශ්චාත් උපාධි පාඨමාලා වෙනුවෙන් පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ සේවය කරනු ලබන කථිකාචාර්යවරුන් 07 දෙනෙකුහට ගෙවන ලද සම්බන්ධීකරණ ගාස්තුවලින් සියයට 10 ක් වූ රු.43,000 ක් විගණන දින වූ 2014 ජනවාරි 20 වන විටත් විශ්වවිද්‍යාලීය අරමුදලට බැර කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඒ) විශ්වවිද්‍යාල ආයතන සංග්‍රහයේ I කොටසේ III පරිච්ඡේදයේ 26 ඡේදය පරිදි බාහිර කථිකාචාර්යවරුන් වෙනුවෙන් දේශනයකට වැයවන මුදල ඉතා අධික වන හෙයින් බාහිර කථිකාචාර්යවරුන් ලබා ගැනීමේ පුරුද්ද අධෛර්ය කළයුතු බවට උපදෙස් දී ඇතත්, අනුමත කථිකාචාර්යවරුන් පුරප්පාඩු සඳහා බඳවා ගැනීමේ කටයුතු සිදු නොකර සමාලෝචිත වර්ෂයේදී බාහිර කථිකාචාර්යවරුන් යොදවා ගෙන ඒ සඳහා එකතුව රු.14,282,952 ක් ගෙවා තිබුණි.

(ඖ) විවිධ ණයගිමියන් යටතේ දක්වා ඇති රු. 5,902,577 ක ණයගිමි ශේෂ 03 ක් වර්ෂ 02 සිට වර්ෂ 08 ක කාලයක් ගත වී ඇතත්, නිරවුල් කිරීමට අදාළ වගකිවයුතු නිලධාරීන් විසින් කටයුතු කර නොතිබුණි.

(ඕ) සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට ගිවිසුම් කඩකළ ආචාර්යවරුන් සහ නිලධාරීන් 214 දෙනෙකුගේ ඇප බැඳුම්කර වටිනාකම රු.203,720,109 ක් වී තිබූ අතර, එයින් රු.200,062,201 මුදලක ඇප බැඳුම්කර මඟින් අය නොකිරීමේ කාලය 1970 වර්ෂයේ සිට 2013 දක්වා වසර 40 කට වැඩි වී තිබුණි.

(ක) සමාලෝචිත වර්ෂය ආරම්භයේ අරමුදල් 12 ක ශේෂයන්ගේ එකතුව රු. 9,024,433 ක් වූ අතර, වර්ෂය තුළදී එම අරමුදල් වෙනුවෙන් රු. 1,651,725 ක් ලැබී, වර්ෂය අවසාන දිනට රු. 10,676,158 ක ශේෂයක් දක්වා වර්ධනය වී තිබුණු අතර, අදාළ අරමුදල්වල අරමුණු ඉටුකර ගැනීම සඳහා යෙදවීමට විශ්වවිද්‍යාලීය කළමනාකාරීත්වය කටයුතු කර නැති බව නිරීක්ෂණය විය.

(කා) කෙටි කාලීන පාඨමාලා පවත්වා ආදායම් ඉපයීම තොරතුරු තාක්ෂණ මධ්‍යස්ථානයෙහි එක් අරමුණක් වී තිබුණද, 2012 වර්ෂය තුළ කිසිදු ආදායමක් උපයාගෙන නොමැති බවත්, 2013 වර්ෂයේදී එක් පාඨමාලාවක් පමණක් පවත්වා රු.240,000 ක ආදායමක් උපයාගෙන තිබුණි. ඒ අනුව මෙම මධ්‍යස්ථානය ආරම්භයේ පැවති කෙටි කාලීන පාඨමාලා ප්‍රමාණය අඩු වී ඇති බවත්, ආදායම් වැඩිකර ගැනීම සඳහා ඉදිරි සැලසුම් හෝ නව පාඨමාලා හඳුන්වාදීම් හෝ සිදුකර නොමැති බවද නිරීක්ෂණය විය.

(කැ) තොරතුරු තාක්ෂණ මධ්‍යස්ථානයේ අපහරණය කළයුතු භාණ්ඩ ඉවත් නොකර කාමර 02 ක ගොඩගසා තිබුණු අතර, පරිගණක විද්‍යාගාර සියල්ලේම පාවිච්චි කළ නොහැකි පරිගණක උපාංග ගබඩා කර තිබුණු බව නිරීක්ෂණය විය. ඉන්වෙන්ට්‍රි ලේඛණය ITC - SB 2 පරිදි 2010 වර්ෂයේදී රු. 528,257 ක බඩු ඉවත්කර තිබුණද, මු.රෙ.770, 772 හා 747 පරිදි කටයුතු කර නොතිබුණි.

(කෑ) විශ්වවිද්‍යාල ශ්‍රේණිගත කිරීමේ එක් ප්‍රධාන නිර්ණායකයක් වශයෙන් විශ්වවිද්‍යාලවල සිදුකරන පර්යේෂණ සලකනු ලබන අතර, ඒ සඳහා භාණ්ඩාගාරයෙන් ලබා දී තිබුණු රු. 12,400,000 ක මුදල අදාළ කාර්යයන් සඳහා නොයොදා ස්ථාවර තැන්පතුවල ආයෝජනය කර තිබුණි.

(කි) ආර්ථික අපහසුතා ඇති ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට ශිෂ්‍යත්ව ලබාදීම සඳහා බාහිර පුද්ගලයින් විසින් විශ්වවිද්‍යාලයට ලබා දී තිබූ පරිත්‍යාග ආයෝජනය කර ලැබෙන පොලියෙන් සියයට 80 ක ප්‍රමාණයක් අදාල කාර්යය සඳහා යොදා ගැනීමට පාලක සභාව විසින් තීරණය කර තිබුණද ඒ සඳහා විධිමත් වැඩ පිළිවෙලක් අඛණ්ඩව ක්‍රියාත්මක කර නොතිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේදී ශිෂ්‍යත්ව පිරිනැමීම සඳහා යොදාගත යුතු රු. 12,801,890 ක මුදලින් සියයට 28 ක් වූ රු. 3,577,098 ක් පමණක් ඒ සඳහා යොදා ගෙන තිබුණි.

(කී) 2004 වර්ෂයේ ලියාපදිංචි වූ විදේශීය වෛද්‍ය ශිෂ්‍යයින්ගේ අධ්‍යයන කාලසීමාව වසර 05 කින් අවසන් වන නමුත්, 2011 වර්ෂයේ අවසානය වන විට ශිෂ්‍යයන් තිදෙනෙකුගේ ලැබීම් ලෙස රු. 1,640,310 ක් ගිණුම්ගත කර තිබුණි.

(කු) දීර්ඝ කාලයක සිට පැවත එන එකතුව රු. 1,821,032 ක ණය ශේෂ අයකර ගෙන නොතිබුණි.

(කු) 2010 මැයි 22 දිනැති 306.3.1.15 පාලක සභා තීරණය අනුව මහාචාර්යවරයෙකුගෙන් මසකට රු. 15,000 බැගින් නිවාස කුලිය අයකළයුතු වුවත්, මසකට රු. 1,000 ක් බැගින් මාස 31 ක් සඳහා රු.31,000 ක් පමණක් අයකිරීම හේතුවෙන් රු. 434,000 ක අලාභයක් විශ්වවිද්‍යාල අරමුදලට සිදුවී තිබුණි.

(කෙ) 2013 වර්ෂයේ සැප්තැම්බර් 15 දින වන විට විශ්‍රාම ගිය නිලධාරියෙකුහට අර්ථසාධක අරමුදලේ මුදල් නිදහස් කර ඇතත්, ඔහුගෙන් අයවිය යුතු හිඟ නිවාස කුලිය වන රු.45,989 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(කේ) පේරාදෙණිය විශ්වවිද්‍යාලයට අයත් රත්මලේ ඉඩමේ පර්චස් 25 ක ඉඩම් කොටසක් 1975 වර්ෂයේ සිට මහනුවර කඩවත් සතර ගඟවට කෝරලේ ප්‍රාදේශීය සභාව වෙත බදු පදනම මත පවරා දී තිබූ අතර, නව තක්සේරු අනුව බදු ගිවිසුම්වලට එළඹිය යුතු වුවද, 1997 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වාම බදු ගිවිසුම් අත්සන් නොකර අදාල දේපල භුක්ති විදීමට කටයුතු කර තිබීම හේතුවෙන් මෙම ඉඩමට අදාලව ප්‍රාදේශීය සභාව වෙතින් අයවිය යුතු රු.6,724,000 ක බදු කුලියක් 2013 දෙසැම්බර් 31 දින වන විට ද අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

4.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා
------------------------------

සමාලෝචිත වර්ෂයේදී විශ්වවිද්‍යාලීය ස්ථිර සේවයේ ආරක්ෂක නිලධාරීන් සහ තාවකාලික ආරක්ෂක සේවයේ නිලධාරීන් වෙනුවෙන් පිළිවෙලින් රු. 40,596,609 ක් සහ රු.55,885,826 ක් වශයෙන් එකතුව රු. 96,482,435 ක් වැටුප් හා දීමනා ලෙස ගෙවීම් කර තිබුණු අතර, එම සේවකයින් අතර අතිරික්ත ආරක්ෂක නිලධාරීන් 111 ක් සිටියදී රු. 10,672,211 ක අතිකාල වියදමක් දරා තිබුණි.

4.3 මතභේදයට තුඩුදෙන ගනුදෙනු
------------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) (i) 1995 අංක 01 දරන විශ්වවිද්‍යාල පනතේ 02 ඡේදය පරිදි යම් මධ්‍යස්ථානයක් පිහිටුවීම සඳහා පාලක සභාවේ එකඟත්වය ලබා ගෙන 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 45 වගන්ති ප්‍රකාරව, අදාළ පාර්ශව සමග විශ්වවිද්‍යාලීය පරිපාලනය ගිවිසුමකට එළඹිය යුතු වුවත්, ඊට අනුකූල නොවන ලෙස කටයුතු කරමින් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ 2012 සැප්තැම්බර් 27 දිනැති UCC/C/PS/7/2 ලිපිය අනුව කොළඹ පිහිටුවා තිබුණු Lanka Education & Research Network (LEARN) ආයතනය පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ තොරතුරු තාක්ෂණ මධ්‍යස්ථානයේ 2013 ජනවාරි මස සිට ස්ථාපිත කර තිබුණි. 2013 දෙසැම්බර් මස වන විටත් එම ආයතනයට ලබා දෙන පහසුකම් වෙනුවෙන් කිසිදු මුදලක් පාලනාධිකාරිය අය කර ගැනීමට කටයුතු කර නොතිබූ නමුත් තොරතුරු තාක්ෂණ මධ්‍යස්ථානයට අන්තර්ජාල පහසුකම් සැපයීම වෙනුවෙන් 2013 වර්ෂයේදී එකතුව රු. 1,985,489 ක් LEARN ආයතනය වෙත ගෙවීම් කර තිබුණි.

(ii) ඉංජිනේරු පීඨයේ අන්තර්ජාල හා සන්නිවේදන සේවා ඒකකය (ICSU) මඟින් පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ අන්තර්ජාල සේවා කටයුතු සහ එහි නඩත්තු සිදුකරනු ලබන අතර, අන්තර්ජාල පහසුකම් ලබාගැනීම සඳහා Lanka Education & Research Network (LEARN) නමැති පෞද්ගලික ආයතනය මඟින් සේවාව ලබාගෙන ඇතත්, 1978 අංක 16 දරන විශ්ව විද්‍යාල පනතේ 45 වගන්තිය ප්‍රකාරව විශ්වවිද්‍යාලීය පරිපාලනය එම ආයතනය සමග ගිවිසුමකට එළඹ නොතිබුණු අතර, සමාලෝචිත වර්ෂයේදී එම සේවාව සඳහා රු. 22,189,833 ක් ගෙවා තිබුණි.

(ආ) 2000 ජනවාරි 19 දිනැති අංක 380 දරන රාජ්‍ය මුල්‍ය චක්‍රලේඛය ප්‍රකාරව, පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථාන සහ කාර්ය මණ්ඩලයට උපදේශන සේවා සැපයීම සඳහා ලැබෙන මුදලින් විශ්වවිද්‍යාලීය පරිපාලන ගාස්තු ලෙස සියයට 5 ක් වෙන් කරනු ලබයි. විශ්වවිද්‍යාලීය කළමණාකාරීත්වය අභිමතය පරිදි මෙම පරිපාලන ගාස්තු මුදලින් සියයට 30 ක් විශ්වවිද්‍යාලයේ පරිපාලන ගාස්තු ලෙස වෙන් කරනු ලබන අතර, මෙම මුදලින් සියයට 25 ක් මුල්‍යාධිකාරී අරමුදලට බැර කරනු ලබයි. භාණ්ඩාගාර අනුමැතියකින් තොරව හා විශ්වවිද්‍යාල ආයතන සංග්‍රහයේ II කොටසේ vii වන පරිච්ඡේදයට පටහැනිව මෙම අරමුදලට වෙන් කරන මුදලින් මුල්‍යාධිකාරී සිය අභිමතය පරිදි තීරණය කරනු ලබන විවිධ වූ ප්‍රතිශතයන්ට අනුව පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ ගිණුම් අංශයේ නිලධාරීන් අතර, 2007 වර්ෂයේ සිට 2013 වර්ෂය දක්වා රු.2,513,645 ක් දීමනා ලෙස ගෙවීම් කර තිබුණි.

(ඇ) පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ දෛනික රාජකාරී කටයුතුවල යෙදීම සඳහා මාසික ගෙවීම් ක්‍රමය යටතේ ලබාගත් බස් රථය සඳහා 2013 මාර්තු සිට දෙසැම්බර් කාලපරිච්ඡේදය වෙනුවෙන් එකතුව රු.1,273,500 ක මාසික කුලියක්ද, රු.348,813.60 ක ඉන්ධන දීමනාද ගෙවා තිබුණු අතර, මෙම කාලය තුළ ධාවනය කළ මුළු කිලෝමීටර් ගණන 9374 ක් වී තිබුණි. ඒ අනුව එක් කිලෝමීටරයක් සඳහා රු. 113.13 සිට රු. 206.90 ක් දක්වා පිරිවැයක් දරා තිබුණි. 2013 මාර්තු 17 සිට දෙසැම්බර් 31 දක්වා කාලය තුළ එක් කිලෝමීටරයක් සඳහා දරා ඇති සාමාන්‍ය වියදම රු. 173.06 කි. විශ්වවිද්‍යාලය සතුව තිබෙන බස්රථ උපරිම ලෙස උපයෝජනයට ගැනීමට අවධානය යොමු නොකර මාසික කුලී පදනම මත ලබාගත් මෙම වාහනයට වැඩි පිරිවැයක් දැරීමට සිදු වීම නිසා විශ්ව විද්‍යාලීය අරමුදලට පාඩුවක් සිදු වී ඇති බව විගණනයේදී නිරීක්ෂණය විය.

(ඈ) විශ්වවිද්‍යාල ආයතන සංග්‍රහයේ I කොටසේ VII පරිච්ඡේදයේ 4.1 ඡේදය II කොටසේ IX පරිච්ඡේදයේ 2.2 ඡේදය ප්‍රකාර අනුමැතියක් නොලබා 2013 වර්ෂයේ තොග සමීක්ෂණ කටයුතු සහ එහි අධීක්ෂණ කටයුතු සිදු කිරීම වෙනුවෙන් නිලධාරීන් 89 ක් සඳහා ඔවුන්ගේ වැටුපෙන් සියයට 40 සිට සියයට 85 ක් දක්වා ප්‍රතිශතයක දීමනාවන් වශයෙන් රු. 1,474,042 ක් නිලධාරීන්ට ගෙවාතිබුණි.

(ඉ) පරිගණක මිලදී ගැනීමේ අරමුණු හෝ සැලැස්මකින් තොරව ඉදිරිපත් කරන ලද සාම්පල් හා සපයා තිබූ පරිගණක අතර නිමැවුම් හා ගුණාත්මකභාවය පිළිබඳ වෙනසක් තිබියදී 2013 අප්‍රේල් 05 වන දින රු.4,950,000 ක් වැය කර පරිගණක 50 ක් පෞද්ගලික ආයතනයකින් මිලදී ගෙන තිබූ අතර, එම පරිගණකවල වගකීම් කාලය 2014 මාර්තු 27 දිනෙන් අවසන් වී තිබූ අතර ඇතැම් පරිගණක ඒ වන විටත් භාවිතයට ගෙන නොතිබුණි.

(ඊ) 2013 පෙබරවාරි 13 සිට 2013 මාර්තු 07 අතර කාලය තුළදී අම්පාර, මොණරාගල, රත්නපුර හා කොළඹ යන දිස්ත්‍රික්ක හතරක ගෘහස්ථ ඖෂධ භාවිතය මිනුම් කිරීමේ ව්‍යාපෘති වෙනුවෙන් වෛද්‍ය පීඨය ඉටුකරන ලද ක්ෂේත්‍ර චාරිකා සඳහා නවාතැන් පහසුකම්, ආහාර පාන සහ ප්‍රවාහන පහසුකම් සඳහා වියදම් දරා ඇති අතර, එම වියදම අදාළ දිස්ත්‍රික්කයේ සැපයුම්කරුවන්ගෙන් ලබා නොගෙන මහනුවර පෞද්ගලික ආයතනයෙන් ලබා ගෙන එකතුව රු. 2,068,265 ක් ගෙවීම් කර තිබුණි. මෙම ව්‍යාපෘතිය සඳහා ඕස්ට්‍රේලියාවේ නිව් කාසල් විශ්වවිද්‍යාලය මඟින් වෛද්‍ය පීඨයට ප්‍රතිපාදන ලැබී ඇත්තේ 2013 මැයි 14 දින වුවත්, එම ප්‍රතිපාදන ලැබීමට පෙර එනම්, 2011 වර්ෂයේදී ව්‍යාපෘති උපදේශන සේවා සහ දත්ත සැකසීමේ හා විශ්ලේෂණ ගාස්තු වශයෙන් රු. 807,500 ක අත්තිකාරම් විශ්වවිද්‍යාල අරමුදලින් ලබා ගෙන ඇති අතර, එම මුදල් නැවත විශ්වවිද්‍යාල අරමුදලට බැර කර නොතිබුණි.

4.4 දෘශ්‍ය අක්‍රමිකතා
-------------------
පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2012 මාර්තු 18 දින ඉංජිනේරු පීඨයේ විශ්‍රාම ගොස් ඇති නිලධාරියෙකුට ලබා දී තිබූ රු.230,000 ක තත්කාර්ය අතුරු අග්‍රිම මුදල විගණිත දින දක්වා පියවා නොතිබුණු අතර, මෙම නිලධාරියාගෙන් 2013 දෙසැම්බර් 31 දිනට නිල නිවාස කුලී සහ හිඟ විදුලි ගාස්තු රු. 188,415 ක්ද අය කිරීමට තිබුණි. තවද, නිලධාරියාගේ සේවා කාලය තුළ ඉංජිනේරු පීඨයට අයත් රු. 554,520 ක මිලදී ගැනීම් තොග ලේඛනවල සටහන් නොකිරීම නිසා ඔහුගෙන් අය කළයුතු රු. 554,520 ක මුදල අයකර ගැනීමට කටයුතු නොකිරීම හේතුවෙන් ආයතනයට සිදුවී තිබෙන රු. 972,935 ක අලාභයක් පාරිතෝෂික මුදලින් අයකර ගැනීමකින් තොරව, 2012 මාර්තු 22 දින රු. 900,700 ක් වටිනා පාරිතෝෂික මුදල නිදහස් කර තිබුණි. මෙම මුදල් විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදලින් අයකර ගැනීමට අවශ්‍ය කටයුතු කර නොතිබුණු බැවින් විශ්වවිද්‍යාල පනතේ 94 වගන්තිය ප්‍රකාරව කටයුතු කළයුතුව තිබුණි.

(ආ) විශ්වවිද්‍යාල ආයතන සංග්‍රහයේ IX පරිච්ජේදයේ 2.1 සහ 2.2 ජේද ප්‍රකාරව, අතිකාල වැඩ සඳහා බලය දිය හැක්කේ ඒ කටයුතු ඉටුකිරීමට වෙනත් කිසිදු මාර්ගයක් නැති අතිවිශේෂ අවස්ථාවලදී සහ නිශ්චිත වශයෙන් නියම කරන ලද්දාවූද, සාමාන්‍ය වැඩ කටයුතුවලින් ඒකාන්තයෙන් පරිබාහිරවූද, හදිසිවූද, සාමාන්‍ය කාර්යාල වේලාව තුළ කළ නොහැකි වැඩ සඳහා පමණක් වුවත්, ඊට අනුකූල නොවන පරිදි 2013 වර්ෂයේ ඔක්තෝබර්, නොවැම්බර්, දෙසැම්බර් මාස සඳහා වැඩ දෙපාර්තමේන්තුවේ අතිකාල සඳහා එකතුව රු. 1,590,435 ක් ගෙවා තිබුණි.

4.5 අරමුදල් ඌන උපයෝජනය
--------------------------------
එකතුව රු. 392,000 ක් වූ ශාස්ත්‍ර පීඨයේ පර්යේෂණ අරමුදල් 05 ක් අරමුණුගත පර්යේෂණයට යොදා නොගෙන 2013 වර්ෂයේදී ආපසු පියවා තිබුණි.

4.6 නිෂ්ක්‍රීය ඌන උපයෝජිත වත්කම්
-------------------------------------
පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2004 වර්ෂයේ ආරම්භ කර තිබූ පරිගණක තොරතුරු මධ්‍යස්ථානය පිහිටුවීමේ මූලික අරමුණු ලෙස විශ්වවිද්‍යාලයේ අභ්‍යන්තර සිසුන් සඳහා පරිගණක පාඨමාලා සහ පුහුණුවීම් ලබාදීමත් බාහිර ආයතන සඳහා කෙටි කාලීන පරිගණක පුහුණුවීම් ලබාදී ආදායම් ඉපයීමත් ලෙස දක්වා ඇතත්, එකී අරමුණු කාර්යක්ෂමතාවයකින් හා ඵලදායිතාවයකින් ඉටු වී නොමැති බැව්, ආයතනයේ පරිගණක සහ විද්‍යාගාර වැඩි කාලයක් තුළ නිශ්ක්‍රීයව පැවතීමෙන් අනාවරණය විය.

(ආ) රු. 33,249,967 ක වටිනාකමින් යුතු වෙනත් අරමුදල් ශේෂ 40 ක් ඒවායේ සඳහන් අරමුණු ඉටුකර ගැනීම සඳහා ප්‍රයෝජනයට නොගෙන දීර්ඝ කාලයක් තිස්සේ නිශ්ක්‍රීයව පැවති බව නිරීක්ෂණය වූ අතර, එම ශේෂ නිරවුල් කිරීමට හෝ ඵලදායී ලෙස ප්‍රයෝජනයට ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) ඉංජිනේරු පීඨයේ අන්තර්ජාල හා සන්නිවේදන සේවා ඒකකය සතු Surge Protectors නමැති උපකරණ අයිතම 06 ක් නිෂ්ක්‍රීයව පැවති අතර, 2012 නොවැම්බර් 21 දින මිලදී ගන්නා ලද සංයුක්ත තැටි 2400 න් රු.43,400 ක් වටිනා සංයුක්ත තැටි 560 ක් 2013 නොවැම්බර් මස වන විටත් පාවිච්චියට ගෙන නොතිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂය තුළ පර්යේෂණ කටයුතු සඳහා ලැබී තිබුණු එකතුව රු.1,928,200 ක අරමුදල් වර්ෂය අවසාන වන විටත්, වියදම් නොකර තිබුණි.

4.7 හඳුනාගන්නා ලද පාඩු

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2011 සිට 2013 වර්ෂය දක්වා සිදු වූ රිය අනතුරු හේතුවෙන් පේරාදෙණිය විශ්වවිද්‍යාලයට දැරීමට සිදු වූ සමස්ථ අලාභය රු. 207,030 ක් වී තිබුණි.

(ආ) ඉංජිනේරු පීඨයට අදාල 2013 පෙබරවාරි 08 දින සිදු වූ CPKC 4977 දරන වාහන අනතුරෙන් සිදු වූ රු. 161,396 ක හානි ඇස්තමේන්තුවට අදාලව ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවෙන් රු.127,542 ක් ලැබී ඇතත්, රු. 33,854 ක් වූ අලාභය වගකිවයුතු නිලධාරීන්ගෙන් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) 2014 ජනවාරි 06 වන දින තොරතුරු තාක්ෂණ මධ්‍යස්ථානයේ සියලුම ස්ථානවල තිබු පරිගණක සහ මධ්‍යම සැකසුම් ඒකක භෞතිකව පරීක්ෂා කළ අතර, එහිදි රු.1,880,358 ක වටිනාකමින් යුතු පරිගණක සහ උපාංගවල ඌනතාවයක්ද රු.539,460 ක අතිරික්තයක්ද නිරීක්ෂණය විය.

(ඈ) 1958 අංක 15 දරන සේවක අර්ථසාධක අරමුදල් පනත හා කම්කරු කොමසාරිස්ගේ අංක ප්‍ර/ආයතන/11 හා 2001 අගෝස්තු 24 දිනැති ලිපියට අනුකූල නොවන පරිදි අධ්‍යයන දීමනාව, අර්ථසාධක අරමුදල් දායකය, විශ්‍රාම වැටුප් අරමුදල, සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල් දායකය හා පාරිතෝෂික ගණනය සඳහා අදාළ කර ගැනීම නිසා සමාලෝචිත වර්ෂය තුළදී පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ පීඨ 08 ට අදාළව අධ්‍යයන කාර්ය මණ්ඩලය වෙනුවෙන් රු. 48,812,616 ක එකතුවක් ගෙවීම නිසා විශ්වවිද්‍යාල අරමුදලට පාඩුවක් සිදු කර තිබුණි.

4.8 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ශාස්ත්‍ර පීඨයේ විවිධ දුෂ්කරතා ඇති පුද්ගලයින් සඳහා ප්‍රවේශ පහසුකම් සැලසීමේ කොන්ත්‍රාත්තුව ව්‍යාපෘති කළමණාකරු විසින් ඉදිරිපත් කරන ලද ප්‍රමාණ පත්‍රය අනුව ඇස්තමේන්තුගත වටිනාකම රු.2,548,806ක් වුවද, අංක 269.4 දරන මුදල් කමිටුව විසින් අනුමත කරන ලද වටිනාකම රු.2,980,006 ක් වේ. ඒ අනුව මුදල් කමිටුව වෙත ඉදිරිපත් කරන ලද ප්‍රමාණ පත්‍රය ප්‍රසම්පාදනය කැඳවීම් ලද ප්‍රමාණ පත්‍රය අතර රු.431,200 ක වෙනසක් නිරීක්ෂණය විය. එමෙන්ම වැඩ විෂයයන් 11 ක ඇස්තමේන්තුගත පිරිවැය ඉක්මවා රු. 374,047 ක් අනුමැතියකින් තොරව වැය කර තිබුණි.

(ආ) ප්‍රසම්පාදන ලියවිලි විවෘත කරනු ලබන කමිටුව විසින් අදාල ප්‍රසම්පාදන ලියවිලි ඇගයීම් කිරීම සඳහා උක්ත අත්පොතෙහි 6.3.3 ප්‍රකාරව, විවෘත කරන ලද ප්‍රසම්පාදන ලියවිලි නැවත මුද්‍රා තබා ඇගයීම් කමිටු වෙත යැවිය යුතු වුවත්, පේරාදෙණිය විශ්ව විද්‍යාලය විසින් කිසිම අවස්ථාවක එලෙස කටයුතු කර නොතිබුණි. ඇගයීම් කමිටුව විසින් කළයුතු කාර්යයන් සියල්ලම මූලධන අංශ විසින් සිදුකර අත්සන් කිරීම සඳහා පමණක් ඇගයීම් කමිටුව වෙත අදාල ලියවිලි ඉදිරිපත් කර තිබුණි.

(ඇ) මාක්ස් ප්‍රනාන්දු ශාලාවට ජලය සැපයීම සඳහා වූ අංක HE/IDD/PFN/2010/05 දරන කර්මාන්තය සඳහා රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශන සංග්‍රහයේ 4.2.2 ට අදාළ නොවන පරිදි අධික කාලයක් වැඩ නිම කිරීමට ලබා දීම, ගිවිසුම් ප්‍රකාරව නියමිත කාලයට වැඩ

අවසන් නොකිරීම, නිර්මාණය හා සැලසුම් පාලක සභාව අනුමත කර නොතිබීම, ප්‍රසම්පාදන මාර්ගෝපදේශන සංග්‍රහයේ 4.7 හා 4.8 වගන්ති ප්‍රකාරව අනුමැතිය ලබා නොගැනීම සිදුව තිබූ අතර, කර්මාන්තයට අදාළව අත්සන් කරන ලද ගිවිසුමේ 5.1(a)(i) ප්‍රකාරව, ගිවිසුම අත්සන් කිරීමෙන් අනතුරුව ඇස්තමේන්තු මුදලින් සියයට 60 ක් වූ රු. 4,200,000 ක අත්තිකාරම් මුදලක් ද නිදහස් කර තිබුණි.

(ඈ) වෛද්‍ය පීඨයේ කාණු පද්ධතිය නවීකරණය කිරීමේ කර්මාන්තය පෞද්ගලික කොන්ත්‍රාත්කරුවෙකු වෙත දින 90 කින් වැඩ අවසන්කර භාරදීම සඳහා 2013 මැයි 10 දින රු.1,952,242 ක මුදලකට ප්‍රසම්පාදනය ප්‍රදානය කර තිබුණි. උක්ත කර්මාන්තය සඳහා කොන්ත්‍රාත්කරුට ගෙවීම් කරන ලද අවසන් බිල්පත අනුව වැඩ වටිනාකම රු. 1,714,072 ක් වන අතර, ඊට අදාළ වැට් බදු මුදල රු. 205,688 ක් විය. එහෙත් මෙම කොන්ත්‍රාත්තුවේ ඉටු කරන ලද වැඩවල ගුණාත්මකභාවය නිසිලෙස දක්නට නොලැබුණු අතර, ප්‍රමිතියට අදාළව ඉදිකිරීම් කර නොතිබුණි.

(ඉ) පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ පිහිනුම් තටාකයේ පැති බැම්ම අලුත්වැඩියා කිරීමේ කර්මාන්තය පෞද්ගලික ආයතනයක් වෙත ලබා දී තිබූ අතර, එහි රු. 825,211 ක් වටිනා වැඩ කොටස් ඉටු කර නොතිබීම, පිරිවිතර ප්‍රකාරව වැඩ අවසන් කර නොතිබීම, ජල කාණුව ඉදිකිරීම සඳහා ඇස්තමේන්තුගත වටිනාකම ඉක්මවා රු.369,803 ක් හෙවත් සියයට 148 ක් අනුමැතියකින් තොරව ගෙවීම් කිරීම, රු.608,550 ක් අධි ඇස්තමේන්තු සකස් කිරීම සහ පස් කියුබ් 42.96 ක් සඳහා රු.155,129 ක මුදලක් වැඩිපුර ගෙවීම් කර තිබීම නිරීක්ෂණය විය.

(ඊ) මාවලවත්ත ශික්ෂණ ගොවිපල සඳහා කම්කරුවන් කුලියට බඳවා ගැනීම 2013 වර්ෂයේ වාර්ෂික මුළු වටිනාකම රු. 2,789,435 ක් වූ අතර, විශ්වවිද්‍යාල ප්‍රසම්පාදන කමිටුවේ ප්‍රසම්පාදන සීමාව වූ රු. 2,000,000 කට යටත් වන පරිදි අවස්ථා 02 කදී විශ්වවිද්‍යාල ප්‍රසම්පාදන කමිටුව විසින් මෙම කොන්ත්‍රාත්තුව පිරිනමා ඇති බව විගණනයේදී නිරීක්ෂණය විය.

(උ) 2012 වර්ෂයේදී අදාළ පාර්ශව සමග ගිවිසුම්වලට එළඹී අලුත්වැඩියාවන් හා ඉදිකිරීම් කොන්ත්‍රාත් එකතු වටිනාකම වූ රු. 26,315,427 ක්වූ කොන්ත්‍රාත් 06 ක් ගිවිසුම් ප්‍රකාරව, සමාලෝචිත වර්ෂය තුළදී වැඩ නිමකොට නොමැති බව නිරීක්ෂණය විය.

(ඌ) 2002 වර්ෂයේ සිට 2010 වර්ෂය දක්වා ටෙන්ඩර් කැඳවා ගිවිසුම් අත්සන් කරන ලද කර්මාන්ත 43 ක් සඳහා එකතුව රු. 69,144,925 ක් ගෙවීම් කර ඇතත්, විගණන දින වන විටත් ගිවිසුම් ප්‍රකාරව කර්මාන්තවල වැඩ නිමකර නොතිබුණු නමුත්, අදාළ කොන්ත්‍රාත්කරුවන් සම්බන්ධයෙන් විශ්වවිද්‍යාල කළමනාකාරීත්වය විසින් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

(එ) රාමනාදන් ශාලාවේ තීන්ත ආලේප කිරීමේ ව්‍යාපෘතිය සඳහා ලංසුකරුවන් 06 දෙනෙකු විසින් මිල ගණන් ඉදිරිපත් කර ඇති අතර, අවම මිල ඉදිරිපත් කර තිබූ කොන්ත්‍රාත් ආයතනයේ මිල ගණන් පිළිනොගැනීමට හේතු නොදක්වා දෙවන අවම මිල ඉදිරිපත් කළ පෞද්ගලික ආයතනය වෙත ප්‍රසම්පාදනය පිරිනැමීම හේතුවෙන් රු.1,779,657 ක අලාභයක් සිදු වී තිබුණි.

(ඒ) රු. 98,564,200 ක් වටිනා කෘෂිකර්ම ඉංජිනේරු ගොඩනැගිල්ලේ වාස්තු විද්‍යාත්මක ව්‍යුහාත්මක සැලසුම් සකස් කිරීමේ ව්‍යාපෘතිය ආරම්භ කිරීම සඳහා ඉඩම් ගොඩනැගිලි කමිටුවේ හා පාලක සභාවේ අනුමැතිය ලබා නොගෙන, ප්‍රසම්පාදන කමිටුව විසින් පිළිගතහැකි කරුණු ඉදිරිපත් නොකර, අවම මිල වූ රු.747,500 ක් ඉදිරිපත් කර තිබූ කොන්ත්‍රාත්කරුට නොදී දෙවන අවම මිල වූ රු.828,000 කට ව්‍යාපෘතිය ප්‍රදානය කර තිබුණු අතර, උපදේශකයින් යෙදවීම පිළිබඳ වියදම් දැරීමට පෙර අදාළ රේඛීය අමාත්‍යාංශයෙන්

අනුමැතිය ලබා නොගෙන 2005 වර්ෂයේදී රු.1,142,640 ක් ගෘහ නිර්මාණ හා උපදේශන සේවා සඳහා ගෙවීම් කර තිබුණද ගිවිසුම් ප්‍රකාරව, ව්‍යාපෘතියේ අනෙක් වැඩ 2013 දෙසැම්බර් 31 දින වන විටත් සිදු කර නොතිබුණි.

(ඔ) මහඉලුප්පල්ලම උප විශ්වවිද්‍යාල අංශයේ පුස්තකාලය ප්‍රතිසංස්කරණය කිරීමේ ව්‍යාපෘතිය සඳහා පෞද්ගලික සමාගමක් සමඟ 2005 ජනවාරි 31 දින රු. 324,279 ක ගිවිසුමකට එළඹ 2005 අප්‍රේල් 30 දිනට පෙර කොන්ත්‍රාත්තුව නිමකිරීමට නියමිතව තිබුණු නමුත් සමාලෝචිත වර්ෂයේදී අදාළ කොන්ත්‍රාත්තුවේ වැඩ අවසන්කර නොතිබියදී කොන්ත්‍රාත්කරු වෙත රු.294,082 ක වාරික මුදල් ගෙවීම් කර තිබුණි.

(ඕ) මාර්ස් ශාලාවේ පළමු මහලේ පිරිමි වැසිකිලි පද්ධතිය අලුත්වැඩියා කිරීමේ ව්‍යාපෘතිය සඳහා පෞද්ගලික ආයතනයක් සමඟ 2011 නොවැම්බර් 14 වෙනි දින එළඹී ගිවිසුම අනුව රු.1,115,940 කට කොන්ත්‍රාත්තුව පිරිනමා 2012 පෙබරවාරි 13 වන දින ව්‍යාපෘතිය අවසන් කිරීමට නියමිතව තිබුණු නමුත්, 2013 දෙසැම්බර් 31 දින වන විට ව්‍යාපෘතියෙහි වැඩ අවසන් කර විශ්ව විද්‍යාල කළමනාකාරීත්වයට භාර දී නොතිබුණු නමුත්, මේ සඳහා රු. 330,305 ක වාරික ගෙවීමක් සිදුකර තිබුණි.

(ක) විශ්වවිද්‍යාල කළමණාකාරීත්වය විසින් පෞද්ගලික ආයතනයක් වෙත රු.7,629,409 ක වටිනාකමින් යුතු කොන්ත්‍රාත් ව්‍යාපෘතින් 05 ක් පිරිනමා ඇතත්, අදාළ කොන්ත්‍රාත් ආයතනය පේරාදෙණිය විශ්වවිද්‍යාලීය කළමණාකාරීත්වය සමඟ එළැඹි ගිවිසුම් කඩකර තිබුණි. නමුත්, ඒ සඳහා අදාළ වගකිවයුතු නිලධාරීන් විධිමත් පියවර ගෙන අලාභ අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(කා) කෘෂි විද්‍යා පීඨයේ සත්ත්ව විද්‍යා දෙපාර්තමේන්තුවේ ඇලුමිනියම් රාමුවෙන් ජනේල සකස් කිරීමේ ඇස්තමේන්තුව අනුව කොන්ත්‍රාත් වටිනාකම රු.1,752,750 ක් වු අතර කොන්ත්‍රාත්තුව පිරිනමන ලද ලංසුකරුගේ වටිනාකම රු.959,400 ක් විය. මේ අනුව දෙපාර්තමේන්තු ඇස්තමේන්තුව හා කොන්ත්‍රාත්තුව පිරිනමන ලද ලංසුකරුගේ අවම මිල අතර රු. 793,350 ක වෙනසක් නිරීක්ෂණය විය.

(කැ) රු.1,444,643 කට වැඩ ඉංජිනේරුවරයා විසින් ඇස්තමේන්තු කරන ලද ගල් බංගලාව අලුත්වැඩියා කිරීමේ කොන්ත්‍රාත්තුව සඳහා 2013 මාර්තු 04 දින මිල විවෘත කිරීමේදී අවම මිල වු රු.971,040 කට කොන්ත්‍රාත්කරු මිල ගණන් ඉදිරිපත් කර තිබුණද, 2013 ජුනි 11 දින එළඹී කොන්ත්‍රාත් ගිවිසුම අනුව ගිවිසුම්ගත කොන්ත්‍රාත් වටිනාකම රු.1,273,440 ක් වී තිබුණු අතර, කොන්ත්‍රාත්කරු ඉදිරිපත් කර තිබුණු මුදලට වඩා රු. 302,400 ක් වැඩිපුර ගිවිසුම් අත්සන් කර තිබුණි.

(කෑ) සිවිල් ඉංජිනේරු අංශ වැඩ බිම වායුසමීකරණ යන්ත්‍ර සපයා සවි කිරීමට අදාළව 2012 අගෝස්තු 21 වන දින ප්‍රථම වරට මිල ගණන් විවෘත කිරීමේදී අවම මිල ලෙස රු.784,500 ක් පෞද්ගලික කොන්ත්‍රාත් ආයතනයක් විසින් මිල ඉදිරිපත් කරන ලද අතර, දෙවන අවම මිල ලෙස රු. 882,680 ක් වෙනත් පෞද්ගලික ආයතනයක් විසින් ඉදිරිපත් කරන ලදී. මෙම මිල ගණන් නොසලකා හැර නැවතත් 2013 පෙබරවාරි 13 දින මෙම ව්‍යාපෘතිය සඳහා මිල ගණන් කැඳවීමේදී දෙවන අවම මිල ගණන් ඉදිරිපත් කළ පෞද්ගලික ආයතනය පමණක් රු.1,050,270 ක මිල ගණන් ඉදිරිපත් කර තිබුණි. එම ආයතනය වෙත අදාළ කොන්ත්‍රාත් ප්‍රදානය කිරීම හේතුවෙන් රු. 265,770 ක අලාභයක් පේරාදෙණිය විශ්ව විද්‍යාලයට සිදු වී තිබුණි.

(කි) පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ ගෘහස්ථ ක්‍රීඩාගාරයේ විදුලි පද්ධතිය නවීකරණය කිරීම සඳහා වු කොත්ත්‍රාත්තුව පුද්ගලික සමාගමක් වෙත පිරිනමා රු.6,351,248 ක් ගෙවීම් කර තිබුණද, එය

නිසියාකාරව ක්‍රියාත්මක නොවීම, සවි කොට තිබූ විදුලි පහන් ඒකීය ධාරිතාවයකින් යුක්ත නොවීම, ක්‍රීඩාගාරය සඳහා සම ආලෝකයක් නොලැබීම වැනි අඩුපාඩු පැවති අතර, විගණන දින වන විට රු. 339,000 ක් වටිනා දැල්නොවන බල්බ 20 ක්ද ගලවා ඉවත් කර තිබුණි. මෙම බල්බ වෙනුවට නව බල්බ මෙරට තුළදී මිලදී ගත නොහැකි බවත් ඒ සඳහා වූ තාක්ෂණික දැනුමක් විශ්වවිද්‍යාලයේ නිලධාරීන්ට නොමැති බවත් අනාවරණය වූ අතර බල්බ සඳහා ලබාදුන් වගකීම් කාලයක්ද නොතිබුණි.

(කී) සම්මේලන මධ්‍යස්ථානයක් ඉදිකිරීමේ ව්‍යාපෘතිය සඳහා 2009 ජනවාරි 20 දින පිඹුරුපත් සැකසීම වෙනුවෙන් රු.1,500,000 ක සංචලන අත්තිකාරම් මුදලක් රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවට ගෙවා තිබූ නමුත්, අවුරුදු 05 ක කාලයක් ඉක්ම වී ඇතත්, මෙම ව්‍යාපෘතිය ආරම්භ කිරීමට හෝ අත්තිකාරම් මුදල් ආපසු අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

4.9 ප්‍රමාද වූ ව්‍යාපෘති
---

පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ රු. 18,715,197 ක් වටිනා කොන්ත්‍රාත් 04 ක් වෙනුවෙන් සියයට 20 සංචලන අත්තිකාරම් වූ රු. 3,450,238 ක් ලබා දී තිබුණු අතර, ඇප සුරැකුම් කාලය ඉක්ම වී ඇතත්, අදාළ ව්‍යාපෘතීන් නිමකර නොතිබුණි.

4.10 කාර්ය මණ්ඩල පරිපාලනය
---

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) විශ්වවිද්‍යාල ආයතන සංග්‍රහයේ 03 වන පරිච්ඡේදයේ 02 උපඡේදය පරිදි පත්කිරීමක් හෝ උසස් කිරීමක් කළ හැක්කේ අනුමත කාර්ය මණ්ඩලයට ඇතුළත් තනතුරකට පමණක් වුවද, අනුමත කාර්ය මණ්ඩලයට ඇතුළත් නොමැති ඉංජිනේරු පීඨයේ අන්තර්ජාල හා සන්නිවේදන සේවා ඒකකයේ තනතුරු 02 ක් සඳහා නිලධාරීන් තිදෙනෙකු පත්කර එකතුව රු. 2,348,289 ක් වූ මුදලක් වැටුප් ලෙස ගෙවා තිබුණි.

(ආ) ජාත්‍යන්තර පර්යේෂණ මධ්‍යස්ථානයේ අනුමත නොවූ තනතුරකට නිලධාරියෙකු බඳවා ගෙන භාණ්ඩාගාර අනුමැතියකින් තොරව, 2012 අප්‍රේල් 02 දින සිට මසකට රු. 125,000 ක් බැගින් මාස 21 ක් සඳහා වැටුප් හා දීමනා ලෙස රු.2,625,000 ක් ගෙවීම් කර තිබුණි.

(ඇ) ජාත්‍යන්තර පර්යේෂණ මධ්‍යස්ථානය පිහිටුවීම සඳහා 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 18(2)(3)(ඊ) වගන්තිය ප්‍රකාරව, නිසි බලධාරීන් වෙතින් විධිමත් අනුමැතියක් ලබා නොගෙන කාර්ය මණ්ඩලය බඳවාගෙන වැටුප් හා දීමනා ලෙස රු.4,234,062 ක් ගෙවීම් කර තිබුණු අතර, ආයතනයේ කාර්යභාරය ඉටුකරගැනීමට අවශ්‍ය මාර්ගෝපදේශ සකස් කර නොතිබුණි.

(ඈ) 2003 ජුනි 02 දිනැති අංක PED/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයෙහි 8.8 වගන්තිය ප්‍රකාරව, ඉංජිනේරු පීඨයේ වාහන නඩත්තු ඒකකයේ සහ වැඩ ඒකකයේ සේවය කරනු ලබන නිලධාරීන් / සේවකයින් සඳහා රාජකාරී බෙදා දීමක් සිදුකර නොතිබුණු නමුත්, 2013 වර්ෂය සඳහා එම ඒකකවලට අනුයුක්තව සේවය කරන ලද නිලධාරීන් / සේවකයින් සඳහා එකතුව රු. 18,020,276 ක වැටුප් ගෙවා තිබුණි.

(ඉ) මුදල් රෙගුලාසි 71 ප්‍රකාරව, අදාල කාර්ය මණ්ඩලයට වැටුප් ගෙවන ප්‍රතිපාදන හෝ අරමුදලේ ප්‍රභවය කුමක් වුවත්, කාර්ය මණ්ඩලයට වැටුප් ගෙවීම සඳහා භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම්වරයාගේ පූර්ව අධිකාරී බලය ලබාගත යුතුය. තොරතුරු තාක්ෂණ මධ්‍යස්ථානය සඳහා කාර්ය මණ්ඩලයක් අනුමත කර නොගෙන තනතුරු 04 ක නිලධාරීන් 06 දෙනෙකු සඳහා 2013 වර්ෂයේදී එකතුව රු. 1,474,347 ක වැටුප් ගෙවා තිබුණි.

(ඊ) විශ්වවිද්‍යාලයේ අනුමත ස්ථිර සේවයේ ආරක්ෂක නිලධාරීන් සංඛ්‍යාව 69 ක් වුවත්, තථ්‍ය ආරක්ෂක නිලධාරීන් 63 ක් සහ පුද්ගලික ආරක්ෂක සේවා මඟින් ආරක්ෂක නිලධාරීන් 117 ක් වශයෙන් ආරක්ෂක නියාමකවරු සහ ආරක්ෂක පරීක්ෂකවරු 180 ක් සේවයේ යොදවා තිබුණ බැවින්, අනුමත කාර්ය මණ්ඩලය ඉක්මවා 111 දෙනෙකු පෞද්ගලික ආරක්ෂක නිලධාරීන් සේවයේ යොදවා තිබුණි.

(උ) අංක PED/12 හා 2003 ජුනි 02 දිනැති රාජ්‍ය ව්‍යාපාර අධ්‍යක්ෂ ජනරාල්ගේ චක්‍රලේඛය ප්‍රකාරව කාර්ය මණ්ඩල කළමනාකරණය කිරීමේදී පුරප්පාඩු පිරවීමට කටයුතු කළයුතු වුවත්, වෛද්‍ය පීඨයට අයත් අධ්‍යයන සහ අනධ්‍යයන කාර්ය මණ්ඩලය පිළිවෙලින් පුරප්පාඩු 45 හා 26 ක් සම්බන්ධයෙන් එසේ කටයුතු කර නොතිබුණි.

## 5. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය
---------------------------------------

### 5.1 සංයුක්ත සැලැස්ම
---------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) රාජ්‍ය ව්‍යාපාර අධ්‍යක්ෂ ජනරාල්ගේ 2003 ජුනි 02 දිනැති PED/12 චක්‍රලේඛය ප්‍රකාරව, සංයුක්ත සැලැස්ම ආයතනයේ පාලක සභා නිලධාරීන්ගේ හා ජ්‍යෙෂ්ඨ කළමනාකරුවන් විසින් ආයතනය පිළිබඳ ඉදිරි දැක්ම වෙනුවෙන් සකස් කරන ලද ප්‍රතිබිම්භයක් විය යුතු වුවද, පහත අඩුපාඩු නිසා සංයුක්ත සැලැස්මෙහි එවැනි අරමුණු ඉටු වී නොතිබුණි.

(i) වාර්ෂික අයවැය සමඟ යාවත්කාලීන කරන ලද සංයුක්ත සැලැස්ම විගණකාධිපති වෙත සෑම මුල්‍ය වර්ෂයක් ආරම්භවීමට අඩුම වශයෙන් දින 15 කට පෙර ඉදිරිපත් කළයුතු වුවද, 2013 වර්ෂයේ යාවත්කාලීන කරන ලද සංයුක්ත සැලැස්ම ඉදිරිපත් කර තිබුණේ 2013 ජුලි 02 වන දීය.

(ii) සංයුක්ත සැලැස්ම සමඟ අයවැයගත ප්‍රාග්ධන වියදම් වාර්ෂික අයවැය සමඟ ඇතුළත්කළයුතු වුවද, අයවැයේ ඇතුළත් කර තිබූ රු. 396,025,000 ක් වූ ප්‍රාග්ධනිත වියදම් 04 ක් සංයුක්ත සැලැස්මේ ඇතුළත් කර නොතිබුණි.

(ආ) 2003 ජුනි 02 දිනැති අංක PED/12 දරන රාජ්‍ය ව්‍යාපාර අධ්‍යක්ෂ ජනරාල්ගේ චක්‍රලේඛයේ 5.2 ඡේදය පරිදි තොරතුරු තාක්ෂණ මධ්‍යස්ථානය සඳහා සංයුක්ත සැලැස්මක් සකස් කර නොතිබුණ අතර, සංයුක්ත සැලැස්මේ අරමුණු ඉටුකරගත හැකි වන පරිදි ක්‍රියාකාරී සැලැස්මක් සකස් කර ක්‍රියාත්මක කළයුතු වුවද, සමාලෝචිත වර්ෂය තුළ ක්‍රියාකාරී සැලැස්මක් ද සකස් කර ද නොතිබුණි.

### 5.2 ක්‍රියාකාරී සැලැස්ම
---------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) එකතුව රු. 83,550,000 ක් වූ අයිතම 32 ක් සමාලෝචිත වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත් කර තිබුණද, මුල්‍ය ප්‍රකාශන සමඟ එම අරමුණු ඉටු වූ බව විගණනයේදී නිරීක්ෂණය නොවීය.

(ආ) සමාලෝචිත වර්ෂයට අදාල සංයුක්ත සැලැස්මේ හා ක්‍රියාකාරී සැලැස්මේ විෂයයන් 31 කට අදාලව එකතුව රු. 211,850,000 ක වටිනාකමේ වෙනසක් නිරීක්ෂණය විය.

5.3 පාලක සභා රැස්වීම්

---

සමාලෝචිත වර්ෂය තුළ පාලක සභා රැස්වීම් වාර 11 ක් පවත්වා තිබුණු නමුත්, රාජ්‍ය ව්‍යාපාර අධ්‍යක්ෂ ජනරාල්ගේ 2003 ජුනි 02 දිනැති PED/12 චක්‍රලේඛයේ 4.2.2 ප්‍රකාරව, කාර්යක්ෂමතාවය අගය කිරීම හා මඟ පෙන්වීම සඳහා ඉදිරිපත් කළයුතු වාර්තා හා තොරතුරු පාලක සභාව වෙත ඉදිරිපත් කර නොතිබුණි.

5.4 අභ්‍යන්තර විගණනය

---

මුදල් රෙගුලාසි 133 ප්‍රකාරව, ආයතනයේ ඒ ඒ ඒකකය වෙන වෙනම අභ්‍යන්තර විගණනයක් සිදු කළයුතු වුවද, තොරතුරු තාක්ෂණ මධ්‍යස්ථානය ආරම්භ කළ 2004 වර්ෂයේ සිට විගණන දිනය වූ 2014 ජනවාරි 08 වන දිනය දක්වාම කිසිදු විගණනයක් සිදුකර නොතිබුණි.

5.5 ප්‍රසම්පාදන සැලැස්ම

---

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය වෙනුවෙන් වැඩ, සැපයුම් සහ සේවා සඳහා ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්මේ වටිනාකම් ඇතුළත් කර තිබුණද, වාර්ෂික අයවැය සමඟ එකතුව රු.4,344,861,500 ක වෙනස්කම් නිරීක්ෂණය විය.

(ආ) සමාලෝචිත වර්ෂයේදී අයවැය මඟින් ඇස්තමේන්තු කරන ලද නමුත්, ප්‍රසම්පාදන සැලැස්මට ඇතුළත් කර නොතිබුණු වටිනාකම් රු. 18,317,000 ක්වූ ව්‍යූහගත සේවා 03 ක් නිරීක්ෂණය විය.

5.6 අයවැය ලේඛනමය පාලනය

---

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය වෙනුවෙන් දුරස්ථ හා අඛණ්ඩ අධ්‍යයන කේන්ද්‍රයේ ඇස්තමේන්තුගත ආදායම සහ වියදම පිළිවෙලින් රු.57,955,000 ක් සහ රු.26,527,000 ක් වූ අතර, සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන අනුව තථ්‍ය ආදායම සහ වියදම පිළිවෙලින් රු. 66,341,099 ක් සහ රු.65,538,406 ක් විය. ඒ අනුව ඇස්තමේන්තුගත ආදායම සහ වියදම ඉක්මවීම පිළිවෙලින් රු. 8,386,356 ක් සහ රු.39,011,406 ක් හෙවත් පිළිවෙලින් සියයට 14 ක් හා සියයට 147 ක් විය.

(ආ) රාජ්‍ය ව්‍යාපාර අධ්‍යක්ෂ ජනරාල්ගේ 2003 ජුනි 02 දිනැති PED/12 චක්‍රලේඛයේ 5.2 ප්‍රකාරව, වාර්ෂික අයවැය වාර්තාව සංයුක්ත සැලැස්මේ වාර්තා අරමුණු ඉටු කර ගැනීම පිණිස උපකරණයක් ලෙස භාවිතා කළයුතු වුවද, පහත දැක්වෙන වෙනස්කම් නිසා අයවැය සඵල මූල්‍ය පාලකයක් ලෙස යොදා ගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය.

(i) වැය විෂයයන් 37 ක ඇස්තමේන්තු ප්‍රතිපාදන ඉක්මවීම්වල එකතුව රු.354,137,482 ක්වූ අතර, වැය විෂයයන් 29 ක අධි ඇස්තමේන්තු කිරීම්වල එකතුව රු.348,673,163 ක් වී තිබුණි.

(ii) අයවැය ලේඛනයට ඇතුළත් නොවූ වැය විෂයයන් 06 කට අදාළව එකතුව රු.155,504,977 ක් වූ වියදම් සමාලෝචිත වර්ෂය තුළදී වැය කොට තිබුණි.

(iii) වැය විෂයයන් යටතේ ප්‍රතිපාදන වෙන් කර ඇතත්, වැය විෂයයන් 05 ක් සඳහා සියයට 100 ක් එනම් රු. 702,000 ක වටිනාකමින් යුතු ප්‍රතිපාදන සමාලෝචිත වර්ෂයේදී ඉතිරි වී තිබුණි.

(iii) අයවැයගත ආදායම් සහ තත්‍ය ආදායම් සැසඳීමේදී වැය විෂයයන් 04 කට අදාළව රු.54,503,907 ක ඌන ආදායමක් දක්නට ලැබුණි.

(iv) අයවැයගත ආදායම් සහ තත්‍ය ආදායම් සැසඳීමේදී ආදායම් ප්‍රභවයන් 11 කට අදාළ රු. 133,334,989 ක අධි ආදායම් දක්නට ලැබුණි.

(v) අයවැයගත ආදායම් ලෙස හඳුනා නොගත් ආදායම් ප්‍රභවයන් 03 ක් යටතේ රු.91,439,412 ක් ආදායම් සමාලෝචිත වර්ෂය තුළදී ලැබී තිබුණි.

(vi) අයවැයගත තොරතුරු අනුව ආදායම් විෂයයන් 04 ක් සඳහා එකතුව රු.58,955,000 ක් ආදායම් වෙන්කර තිබුණු නමුත්, සමාලෝචිත වර්ෂය තුළදී එම ආදායම් විෂයයන් වෙනුවෙන් ආදායම් ලබාගෙන නොතිබුණි.

(ඈ) M. Phill හා PHD උපාධි අපේක්ෂකයින් වෙත විදේශීය ආයතනවල උපාධි පාඨමාලා හැදෑරීම සඳහා අවශ්‍ය අරමුදල් සැපයීම වෙනුවෙන් රුපියල් මිලියන 10 ක මුදලක් වෙන්කර ඇතැත්, කිසිදු අයකු වෙත එම කටයුතු සඳහා මූල්‍යාධාර සපයා නොතිබුණි.

(ඇ) රාජ්‍ය ව්‍යාපාර අධ්‍යක්ෂ ජනරාල්ගේ 2003 ජූනි 02 දිනැති PED/12 චක්‍රලේඛයේ 5.2.1 ප්‍රකාරව, අයවැයගත ශේෂ පත්‍රයක් ඉදිරිපත් කළයුතු වුවද, 2013 වර්ෂය සඳහා අයවැයගත ශේෂ පත්‍රයක් ඉදිරිපත් කර නොතිබුණි.

6. පද්ධති හා පාලනයන්
------------------------

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන දුර්වලතා වරින්වර උපකුලපතිවරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතු වේ.

(අ) ගිණුම්කරණය
(ආ) අත්තිකාරම් ශේෂ නිරවුල් කිරීම
(ඇ) තොග පාලනය
(ඈ) වාහන පරිපාලනය
(ඉ) පර්යේෂණ ප්‍රදාන සහ අරමුදල් උපයෝජනය
(ඊ) කාර්ය මණ්ඩල පරිපාලනය
(උ) ප්‍රසම්පාදන ක්‍රියාවලිය
(ඌ) සේවක ණය පරිපාලනය
(එ) කොන්ත්‍රාත් පරිපාලනය